**බේස් ලයින් මාර්ග ව්‍යාපෘතියේ අදියර III - 2020**

----------------------------------------------------

බේස්ලයින් මාර්ග ව්‍යාපෘතියේ - අදියර III 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.මෙම ව්‍යාපෘතිය 2009 නොවැම්බර් 19 දින පවත්වන ලද කැබිනට් අමාත්‍යවරුන්ගේ රැස්වීමේදී ගත් තීරණයක් යටතේ ක්‍රියාත්මක කරන ලදි. පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතු යැයි මා සලකන මාගේ අදහස් සහ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

----------------------------------------------------------------

ව්‍යාපෘතියේ තොරතුරු අනුව, මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණ වනුයේ කිරුළපන සිට කොළඹ හොරණ මාර්ගය දක්වා මීටර් 860ක් දිග නව මාර්ගයක් ඉදි කිරීම මඟින් මාර්ග තදබදය අවම කිරීමයි. දෙපස උස් වූ ඇවිදින මංතීරු සහිතව එක් පසකට ද්විත්ව ප්‍රවාහන මංතීරු සහිතව මංතීරු 03 සහ මාර්ගය වෙන්කරන මැද පිහිටි කොටසකින් මෙම මාර්ගය ඉදිකෙරේ. මෙම ව්‍යාපෘතිය 2009 නොවැම්බර් 19 දින පවත්වන ලද කැබිනට් අමාත්‍යවරුන්ගේ රැස්වීමේදී ගත් තීරණයක් යටතේ ක්‍රියාත්මක වේ. ඉඩම් අත්පත්කර ගැනීම සඳහා ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 4,860ක් වන අතර ඉදිකිරීම් පිරිවැය සඳහා රු.මිලියන 5,250 වේ. කෙසේවෙතත්, ව්‍යාපෘතියේ සිවිල් ඉදිකිරීම් කටයුතු ආරම්භ කර තිබුණු අතර ඉදිකිරීම් සඳහා අවශ්‍ය අරමුදල් 2021 ජුනි 30 දින වන විටත් සැලසුම් කර නොතිබුණි.

**1.3 මතය**

------

මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂ සඳහා එහි මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

**1.4 මතය සඳහා පදනම**

------------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්**

----------------------------------------------------------------------------------------------------

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව පිළියෙල කිරිම සත්‍ය හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තිරණය කිරිම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම පිළිබඳව වගකීම ඊට සම්බන්ධ පාර්ශවය විසින් දරනු ලබයි.

**1.6** මූල්‍ය ප්‍රකාශන විගණනය කිරීම සම්බන්ධව විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හෝ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත්කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රීලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී ඒ සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා හා වැරදි තනිව සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑම් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය හා වෘත්තීය සැකයෙන් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් හා ක්‍රියාත්මක කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ යෝග්‍ය විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මඟින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතු වේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබාගන්නා ලද නමුත්,අභ්‍යන්තර පාලනයේ ඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සහ සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- හෙළිදරව් කිරීම් ඇතුළත්ව මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම,ව්‍යූහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගණුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

මාගේ විගණනයේදී මා හඳුනාගන්නා අභ්‍යන්තර පාලනයේ සැලකිය යුතු අඩුපාඩුද ඇතුළුව සැලකිය යුතු විගණන සොයාගැනීම් හා අනෙකුත් කරුණු සම්බන්ධයෙන් ඊට සම්බන්ධ පාර්ශවයන් සමඟ මම සන්නිවේදනය කරමි.

**2.** කොන්ත්‍රාත් පරිපාලනය

---

| | විගණන ගැටලුව | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | කිරුළපන සිට රත්මලාන මැලිබන් හන්දිය දක්වා කිලෝමීටර් 7.42ක දිගින් යුතු මාර්ග ඉදිකිරීමට 2004 අගෝස්තු 12 දිනැති අමාත්‍ය මණ්ඩල අනුමැතිය පරිදි බේස්ලයින් මාර්ග ව්‍යාපෘතියේ III වන | එකඟවේ. 2009 නොවැම්බර් 19 දිනැති අමාත්‍ය මණ්ඩල අනුමැතිය අනුව, වැඩ විෂය පථය කිලෝමීටර් 0.86ක් දක්වා අඩු | ව්‍යාපෘතියේ පිරිවැය සහ එහි වැදගත්කම සලකමින් ආරම්භයේදී ව්‍යාපෘතියේ කටයුතු නිසි පරිදි හඳුනා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අදියර මූලිකවම **2004**දී ආරම්භ වී තිබුණි. කෙසේවෙතත්, **2009** නොවැම්බර් **19** දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව, ව්‍යාපෘතියේ පිරිවැය සහ කොළඹ ප්‍රදේශයේ වාහන තදබදය අඩු කිරීමට එහි ඇති වැදගත්කම සලකා මෙම මාර්ගයේ දිග කිලෝමීටර් **0.86**ක් දක්වා පසුව අඩු කර තිබුණි. | කිරීමට මාර්ග සංවර්ධන අධිකාරියට ව්‍යාපෘතියේ සිදුවිය. | |
| (ආ) | **2009** නොවැම්බර් **19** දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව ව්‍යාපෘතියේ විෂය පථය කිලෝමීටර් **0.86**ක් දක්වා අඩු කර තිබුණද, **2020** දෙසැම්බර් **31** දිනට වර්ෂ **11**ක් ගතවී ඇතත් මාර්ගයේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට නොහැකිවී තිබුණි. තවද, **2020** දෙසැම්බර් **31** දිනට ඉඩම් අත්පත් කර ගැනීමේ පිරිවැය සහ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය පිරිවැය සඳහා ශ්‍රී ලංකා රජය එකතුව රු. මිලියන **1,988**ක් දරා තිබුණු බව නිරීක්ෂණය විය. | එකගවේ. ආරම්භයේදී මෙම ව්‍යාපෘතියට එරෙහිව විශාල මහජන විරෝධතා පැවතුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, ව්‍යාපෘතියේ කටයුතු වළක්වාලමින් මාර්ග සංවර්ධන අධිකාරියට එරෙහිව අභියාචනාධිකරණය සහ ශ්‍රේෂ්ඨාධිකරණයේ විශාල නඩු ප්‍රමාණයක් ගොනු කර තිබුණි. **2009** සංශෝධිත අමාත්‍ය මණ්ඩල තීරණය හේතුවෙන් පෙත්සම්කරු විසින් අභියාචනාධිකරණයේ පවරා තිබුණු නඩුව ඉවත් කරගෙන තිබුණි. | ඉඩම් අත්පත් කර ගැනීමේ සහ මාර්ග ඉදිකිරීමේ කටයුතු කඩිනම් කිරීමට පියවර ගත යුතුය. |

**3.** ඉඩම් අත්පත් කර ගැනීම සම්බන්ධ ගැටලු

----------------------------------------

| විගණන ගැටලුව | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශ |
|---|---|---|
| සංශෝධිත විෂය පථය මත ඉඩම් කොටස් **202**ක් අත්පත් කර ගැනීමට අවශ්‍ය වුවද, ව්‍යාපෘතිය සියයට **23**ක් නියෝජනය කරන ඉඩම් කොටස් **46**ක් පමණක් අත්කරගෙන තිබුණු අතර **2020** දෙසැම්බර් **31** දිනට රු.මිලියන **1,494**ක වන්දි මුදලක් ගෙවා තිබුණි. තවද, අරමුදල් නොමැතිවීම හේතුවෙන් **2021** ජුනි **30** දිනට ඉඩම් කොටස් **66**ක් සඳහා ආසන්න වශයෙන් වන්දි මුදලින් සියයට **45**ක් වන පොළිය රු. මිලියන **386.44** ක් ඇතුලුව වන්දි මුදල් රු. මිලියන **849.35**ක් නිරවුල් කිරීමට නොහැකිවී තිබුණි. | එකගවේ. | සමස්ත සැලැස්ම සලකමින් අත්පත් කර ගත හැකි ඉලක්ක තීරණය කළ යුතු අතර ඒ අනුව ප්‍රතිපාදන ඉල්ලුම් කළ යුතුය. |